# පුස්තකාල ප්‍රවෘත්ති

## நூலகச் செய்திகள் LIBRARY NEWS


ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය


இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

14 වන වෙළුම, 1 වන කලාපය / 1993 ජනවාරි - මාර්තු

மலர் 14, இதழ் 1 / ஜனவரி - மார்ச் 1993

Vol: 14, No. 1 / 1993 January - March





ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
ශ්‍රී ලංකා යුධ හමුදාවට රු. 50,000 ක් වටිනා
පොත් තොගයක් පරිත්‍යාග කිරීම
இலங்கை தரைப்படையினருக்கு ரூ. 50,000/-
பெறுமதியான நூல்கள் இலங்கை தேசிய நூலக
சேவைகள் சபையினால் அன்பளிப்புச் செய்யப் பட்டது
Rs. 50,000/- worth books were donated to the
Sri Lanka Army by the Sri Lanka National
Library Services Board – 1992.11.12




කොළඹ රාජකීය විද්‍යාලයේ සිසුන් සඳහා පැවති
පුස්තකාල විද්‍යා පුහුණු වැඩ සටහන
கொழும்பு றோயல் கல்லூரி மாணவர்களுக்கு
ஒரு பயிற்சி ஒழுங்கு
A Training Programme for the students of Royal College
Colombo 1992.12.17





මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් ආනන්ද
වීරරත්න මහතා මහනුවර කඩවත් සතර ගඟවට
කෝරළේ ප්‍රාදේශීය සභාව මෙහෙය වූ සාහිත්‍ය උත්සවය ඇමතීම
கடவத் சத்தர கங்கவட்ட கோறளே பிரதேச
சபையினால் ஒழுங்கு செய்யப் பட்ட இலக்கிய
தின விழாவின்போது உரையாற்றும், மத்திய
மாகான, உள்ளூராட்சி ஆணையாளர் திரு.
ஆனந்த வீரரத்ன அவர்கள்
Mr. Ananda Weeraratne Commissioner, Local Govt.
Central Province addresses to "Literary Day Meeting"
organised by Kadawath Sathara Pradeshiya Sabhawa,
Kandy – 1993.01.30

"මත් ද්‍රව්‍ය දුරලමු – පොත්පත් කියවමු" සම්මන්ත්‍රණය,
අවිස්සාවේල්ල
தவிர்க்க வேண்டியது போதைவஸ்து -
நாடவேண்டியது நூல்கள் - கருத்தரங்கு அவிசாவளை
"No to Drugs – Yes to Books" Seminar, Awissawella – 1993.02.1/2



# පුස්තකාල ප්‍රවෘත්ති
## நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය
இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்
THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA
ආරම්භය ஆரம்பம் Established 1973



**14 වන වෙළුම 1 වන කලාපය**
**1993 ජනවාරි – මාර්තු**



සංස්කාරක උපදේශක මණ්ඩලය
ඊශ්වරි කොරයා
සභාපති
එම්. එස්. යූ. අමරසිරි
අධ්‍යක්ෂ
එච්. එම්. ගුණරත්න බණ්ඩා
සහකාර අධ්‍යක්ෂ
ජානකී ප්‍රනාන්දු
වැඩබලන සහකාර අධ්‍යක්ෂ

ප්‍රධාන සංස්කාරක
මිල්ටන් මලවි ආරච්චි
විශේෂ සංස්කාරක
නන්දසීලි ගලගෙදරගේ
සෝදුපත් කියවීම
යූරිකා පද්මිණී මුණසිංහ
කවර චිත්‍රය සහ සැලසුම්
කේ. එම්. අයි. ස්වර්ණසිංහ
ඡායාරූප
ප්‍රමිලා ධර්මරත්නම්



මුද්‍රණය
සීමාසහිත යුනයිටඩ් මර්චන්ට්ස්
කොළඹ 13.
බෙදාහැරීම
අලෙවි හා ප්‍රචාරණ අංශය
ප්‍රකාශනය
අධ්‍යාපන හා පුහුණු අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත කොළඹ 07 ශ්‍රී ලංකාව.
දුරකථනය : 687583-698847
ෆැක්ස් : 941-685-201



© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1993



කලාපයක මිල රුපියල් 25.00
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් මුදල් හා තැපැල් ඇණවුම්පත්
'සභාපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය'
නමට යොමු කරන්න.



***மலர் 14 இதழ் 1***
***ஜனவரி – மார்ச் 1993***



*பதிப்பாசிரியர் ஆலோசனைக் குழு*
ஈஸ்வரி கொறயா
தலைவர்
எம். எஸ். யு. அமரசிறி
நெறியாளர்
எச். எம். குணரத்ன பண்டா
உதவி நெறியாளர்
ஜானகி பெர்ணாண்டோ
பதில் உதவி நெறியாளர்

*பிரதம பதிப்பாசிரியர்*
மில்டன் மலவிஆரச்சி
*விசேட பதிப்பாசிரியர்*
நந்தசீலி கலகெதரகே
*அச்சு சரிபார்த்தல்*
யூரிகா முணசிங்ஹ
*மேலுறைச் சித்திரம்*
கே. எம். ஐ. ஸ்வர்ணசிங்ஹ
*புகைப்படப்பிடிப்பாளர்*
பிரமிளா தர்மரட்ணம்



*அச்சகத்தார்*
யுனைட்டட் மேர்ச்சன்ஸ் லிமிட்டட்
கொழும்பு – 13
*விநியோகிப்பாளர்*
சந்தைப்படுத்தல், விளம்பரப்படுத்தற் பிரிவு
*வெளியிடல்*
கல்வி, பயிற்சிப் பிரிவு
ஸ்ரீலங்கா தேசிய நூலகம்
ஸ்ரீலங்கா தேசிய நூலக சேவைகள் சபை, சுதந்திர வழி, கொழும்பு – 7
ஸ்ரீ லங்கா.
தொலைபேசி – 687583 – 698847
பெக்ஸ் 941 – 685 – 201



© ஸ்ரீலங்கா தேசிய நூலகம் 1993



பிரதியின் விலை ரூபா 25.00
ஆண்டுச் சந்தா ரூபா 100.00

சகல காசோலைகள், தபால் கட்டளைகள், காசுக் கட்டளைகளும் "தலைவர், ஸ்ரீலங்கா தேசிய நூலக சேவைகள் சபை" யின் பெயருக்கு எழுதப்பட வேண்டும்.



**Volume 14 No. 1**
**January - March 1993**



*Advisory Board of Editors*
Ishvari Corea
**Chairman**
M. S. U. Amarasiri
**Director**
H. M. Gunaratne Banda
**Asst. Director**
Janaki Fernando
**Asst. Director (Actg.)**

*Editor in Chief*
Milton Malawiarachchi
*Special Editor*
Nandaseeli Galagedarage
*Proof Reading*
Urika Padmini Munasinghe
*Cover & Design*
K. M. I. Swarnasinghe
*Photographer*
Pramila Tharmaratnam



*Printers*
United Merchants Ltd.
Colombo 13.
*Distributed by*
Sales and Publicity Unit
*Published by*
Education and Training Division
National Library of Sri Lanka
Sri Lanka National Library Services Board
Independence Avenue Colombo 07
Sri Lanka.
*Tel* : 687583 - 698847
*Fax* : 941 - 685 - 201



© National Library of Sri Lanka 1993



Price per Copy Rs. 25.00 $ 2.50
Annual Subscription Rs. 100 $ 10.00

All cheques, Postal and Money orders should be forwarded to
"Chairman
Sri Lanka National Library
Services Board"

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| කතුවැකිය | 2 |
| පුවත් | 3 - 5 |
| පුස්තකාල ප්‍රමිතීන් | 6 |
| செய்திகள் | 7 |
| NEWS | 8 |
| ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය හා ශ්‍රී ලංකාව : සංසන්දනාත්මක විග්‍රහයක්<br>නාලිනී ද සිල්වා | 9 - 13 |
| தேசிய உசாவு துணை நிலையத்தின் முக்கியத்துவம்.<br>எச். எம். குணரத்ன பண்டா | 14 - 15 |
| **Reading Animation and Promotion of the Reading Habit**<br>Piyawathie Jayasuriya. | 16 - 17 |
| ජාතික අධ්‍යාපන තොරතුරු මධ්‍යස්ථානයක්<br>ටී. ඩී. ඩී. ගුණසේකර | 18 - 20 |
| **A Note on Some Early Printed Library Catalogues in Sri Lanka**<br>Piyadasa Ranasinghe | 21 - 24 |


# කතුවැකිය

## නව තාක්ෂණය සහ පුස්තකාල සේවාව

පරිගණක භාවිතය සෑම විෂය ක්ෂේත්‍රයකටම ප්‍රවේශ වීමෙන් කර ඇති බලපෑම අතිමහත් ය. දැනුම අඩංගු මාධ්‍යයන් වන පොත්පත්, වාර සඟරා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් රැස්කිරීම, විශ්ලේෂණය, විඥාපන තිරාවරණය සහ සංරක්ෂණය යන කටයුතු ඉටු කර ලීම පුස්තකාල සේවාවේ මූලික කාර්යයන් වේ. විඥාපන ගබඩා කර ඒවා අදාල පර්යේෂකයින්ට යොමු කිරීම ඇතුළු ක්‍රියාවලීන් ඉක්මණින් හා පහසුවෙන් ඉටු කර ගැනීමට පරිගණකය ඉවහල් කර ගත හැක. එනිසා ශ්‍රමිකව ඉටු කෙරෙන පුස්තකාල ක්‍රියාවලීන් නූතනයේදී සම්ප්‍රදායානුකූල තත්ත්වයකට පත්ව ඇත.

පරිගණකය උපකාරී කරගෙන දත්ත පදනම් ඇති කර ගැනීමට හැකිවන අතර CD-ROM වැනි සූක්ෂම තැටි උපයෝගී කරගෙන විශාල දැනුම් සම්භාරයක් එක් තැටියක ගබඩා කර ගැනීමට පුළුවන. සංවර්ධිත රටවල් මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල ද පරිගණකය මැනවින් භාවිතා කිරීමට අවශ්‍ය පොදු කාර්ය රටාව සකස් වී ඇත. විදුලි සංදේශනය, පෘථිවි චන්ද්‍රිකා මධ්‍යස්ථාන, දුරස්ථ ගවේෂණ මාර්ග යනාදිය ඒවාට නිදසුන් වේ.

එහෙයින් ලෝකය එකම විඥාපන ගම්මානයක් (Global Village) යන සංකල්පය ප්‍රායෝගිකව සකස්වීමේ ලකුණු පහළ වී ඇත.

නව තාක්ෂණ මෙවලම් යොදා ගැනීමේදී ඒවායේ මිල අධිකබව, පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟකම පිළිබඳ ප්‍රශ්න ශ්‍රී ලංකාව වැනි රටවලට මුහුණ පෑමට සිදුවී ඇති දුෂ්කරතාවන්ය. පුස්තකාල සේවාව සඳහා වෙන්වන සීමිත මුදල් ප්‍රතිපාදනවලින් නව තාක්ෂණයට පිවිසීමේදී කල හැකි එක් විසඳුමක් වනුයේ සාමූහික සම්පත් උපයෝජනය පරමාර්ථ කරගෙන විඥාපන ජාල ඇති කර ගැනීම වේ. ඒ සඳහා පුස්තකාලයාධිපතිවරුන් තුල ආකල්පමය වෙනසක් ඇති කර ගැනීම පූර්ව අවශ්‍යතාවයකි.

– විශේෂ සංස්කාරක

## පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් ඇරඹේ

පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් කොළඹ විශ්ව විද්‍යාලය විසින් මෙම වසරේදී ආරම්භ කර ඇත. මෙම ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පහසුකම් සම්බන්ධයෙන් පවතින අඩුපාඩු සපුරාලීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. පුස්තකාල හා තොරතුරු විද්‍යාව සම්බන්ධ වෘත්තිකයින් පුහුණු කිරීමත් ඔවුන්ට එකී ක්ෂේත්‍රයේ නව තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගන්නා ආකාරයත් පර්යේෂණ කටයුතුවල යෙදීමේ වටිනාකම අවබෝධ කිරීමත් මෙම පාඨමාලාවේ අනෙකුත් ප්‍රධාන අරමුණු අතර වේ.

## පුස්තකාල ශ්‍රේණිගත කිරීම

පහත සඳහන් පුස්තකාල 1992 වසරේදී පුස්තකාල සේවා මණ්ඩලය විසින් ශ්‍රේණිගත කරන ලදී.

* ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පුස්තකාලය
* වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පුස්තකාලය
* නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තු පුස්තකාලය
* ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු පුස්තකාලය
* මහවැලි හා ඉඩම් අමාත්‍යාංශ පුස්තකාලය
* ක්‍රීඩා අමාත්‍යාංශ පුස්තකාලය
* නිවාස සැලසුම් සංවර්ධන ආයතන පුස්තකාලය
* ජාතික ධීවර පුහුණු ආයතන පුස්තකාලය
* ශ්‍රී ලංකා ධීවර අභ්‍යාස ආයතන පුස්තකාලය
* ඇඹිලිපිටිය ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පුස්තකාලය
* නුගේගොඩ සමුද්‍රදේවි බාලිකා විද්‍යාලයීය පුස්තකාලය

## ප්‍රදර්ශන

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් 1992 වසරේදී දිවයින පුරා පොත් ප්‍රදර්ශන සහ විකුණුම්හල් ගණනාවක් පවත්වන ලදී. පාඨකයින් වෙත නව ප්‍රකාශන පිළිබඳව අවබෝධයක් ලබා දීමත් පහසු මිලට ප්‍රකාශන මිළට ගැනීමට අවස්ථාවක් සැපයීමත් මෙම ප්‍රදර්ශනවල ප්‍රධාන පරමාර්ථය වේ. පහත සඳහන් ප්‍රදර්ශන මණ්ඩලය විසින් පවත්වා ඇත.

* කළුතර ජනාධිපති ජංගම සේවය (ජනවාරි)
* අනුරාධපුර මහජන පුස්තකාලය (පෙබරවාරි)
* පොකුණුවිට ජනසෙත පදනම් පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය (පෙබරවාරි)
* රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය (මාර්තු)
* මාතලේ "මහපොළ" (අප්‍රියෙල්)
* වවුනියාව ජනාධිපති ජංගම සේවය (මැයි)
* බුත්තල 92 - ගම්උදාව (ජූලි)
* මහියංගන රාජ්‍ය සාහිත්‍ය උත්සවය (සැප්තැම්බර්)
* ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය -සාහිත්‍ය මාසය(සැප්තැම්බර්)
* දෙහිවල "මහපොළ" (ඔක්තෝබර්)
* අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය "ඉසුරුපාය" (නොවැම්බර්)

# පුවත්

## අන්තර් ජාතික පොත් හුවමාරු වැඩ පිළිවෙල

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොත්පත් සහ අනිකුත් පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීමේ විවිධ වැඩ පිළිවෙලවල් අතරින් අන්තර් ජාතික පොත් හුවමාරු ක්‍රමය වැදගත් තැනක් ගනී. 1992 වසරේ දී මේ යටතේ විදේශීය පුස්තකාල 24ක් සමඟ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පොත්පත් හුවමාරු කරගන්නා ලදී. මෙම පුස්තකාල අතරින් වැඩි ප්‍රමාණයක් ඒ ඒ රටවල ජාතික පුස්තකාල වේ.

## ISBN ව්‍යාපෘතිය

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය යටතේ 1992 වසර තුළ දී නව ප්‍රකාශකයින් 152 ක් ලියා පදිංචි කරගන්නා ලදී. මේ අය අතර වාණිජ ප්‍රකාශකයින් 18 ක්ද, රජයේ හා වෙනත් ආයතනික ප්‍රකාශකයින් 30 ක් ද, කතෘ ප්‍රකාශකයින් 84 දෙනෙක් ද වූහ. 1992 වසර තුළ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් ISBN අංක 966 ක් ප්‍රකාශකයින් වෙත සපයන ලදී.

## පුස්තකාල ලී බඩු උපකරණ පරිත්‍යාග

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නව පුස්තකාල ගොඩනැගිලි ඉදි කරන පුස්තකාල සඳහා පුස්තකාල ලීබඩු උපකරණ පරිත්‍යාග කිරීම පසුගිය වසර ගණනාව තිස්සේ ඉටු කර ගෙන යනු ලැබේ. වඩාත් පහසුකම් ඇති හොඳ පුස්තකාල ගොඩනැගිලි ඉදි කිරීමට අදාළ අධිකාරීන් පෙළඹවීම මේ අන්දමට පුස්තකාල ලීබඩු උපකරණ පරිත්‍යාග කිරීමේ ප්‍රධාන අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය යටතේ නව පුස්තකාල ගොඩනැගිලි ඉදි කළ පහත සඳහන් පුස්තකාල වෙත මණ්ඩලය විසින් 1992 වසරේ දී ලීබඩු උපකරණ පරිත්‍යාග කර ඇත.

වාරියපොල සංඝබෝධි පර්ෂද මූලස්ථ විද්‍යාලය.
කෑගල්ල දෙහිඕවිට පනාවල මහා විද්‍යාලය.
ගා/මාපලගම මධ්‍ය මහා විද්‍යාලය.
ත්‍රිකුණාමලය මධ්‍ය මහා විද්‍යාලය.
ත්‍රිකුණාමලය මුස්ලිම් මහා විද්‍යාලය.
මො/තන්නපුරාව මහා විද්‍යාලය.
තිකවැරටිය බමුණුගම මහා විද්‍යාලය.
කුලි/ගල්ගම්මුල්ල මහා විද්‍යාලය.
වත්තල ශාන්ත අන්තෝනි මහා විද්‍යාලය.
කුලි/පිහිඹිය රත්මලේ මහා විද්‍යාලය.
බෝමිරිය මුනිදාස කුමාරතුංග මහා විද්‍යාලය.
මීග/බෝලවලාන මහා විද්‍යාලය.
මො/ඔක්කම්පිටිය මධ්‍ය මහා විද්‍යාලය.
මාගම්මන මහා විද්‍යාලය.
තිකවැරටිය සිරිසුමන මහා විද්‍යාලය.
ගා/ධීරානන්ද මහා විද්‍යාලය.
ගල්ඔළුව මුස්ලිම් මහා විද්‍යාලය.
වුල්වෙන්දාල් බාලිකා මහා විද්‍යාලය.

කළු/අල්හම්බ්‍රා විද්‍යාලය.
සමුද්‍රදේවි බාලිකා මහා විද්‍යාලය.
කළු/නැහින්න කණිෂ්ඨ විද්‍යාලය.
ගම්/කරුණාරත්න බෞද්ධ මහා විද්‍යාලය.
ත්‍රිකුණාමලය බටහිර දෙමළ විද්‍යාලය.
ගම්/කිරිඳිවිට ගැමුණු කණිෂ්ඨ විද්‍යාලය.
දිවුලපිටිය කණිෂ්ඨ විද්‍යාලය.
මිනු/අස්ගිරිය ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලය.
මො/ගැඩවිල කණිෂ්ඨ විද්‍යාලය.
හිඟුරුගමුව සිරිසුමන විද්‍යාලය.
සියනෑ යොවුන් තාක්ෂණික විද්‍යා පීඨය.
මහනුවර අස්ගිරි විහාරයීය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය.
පේරාදෙණිය ශ්‍රී භාරතී විද්‍යායතන පිරිවෙන.
ගම්/විද්‍යාශේඛර මහා පිරිවෙන.
කු/පොල්ගොල්ල පිරිවෙන.
හාකාගල ශ්‍රී සුමංගල පිරිවෙන.
පතහවත්ත ශ්‍රී ස්වර්ණජෝති පිරිවෙන.
මොණරාගල මහජන පුස්තකාලය.
කොටගල මහජන පුස්තකාලය.

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සිතියම් එකතුව

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් පවත්වා ගෙන යනු ලබන සිතියම් එකතුව පර්යේෂකයින්ට මෙන්ම භූගෝල විද්‍යා විෂය හදාරන්නන්ට ඉතාම වැදගත් වේ. අඟලේ සිතියම්, මෙට්‍රික් සිතියම්, භූමි පාරිභෝගික සිතියම් හා මහාද්වීප සිතියම් වලින් මේ එකතුව සමන්විත වේ. මේ හැරුණුවිට ලෝකයේ විවිධ රටවල් හා මහාද්වීපයන් පිළිබඳ තොරතුරු ඇතුලත් සිතියම් පොත් ද මීට ඇතුලත් වේ. උදාහරණයක් වශයෙන් " The Times Atlas of the World, Reader's Digest Atlas of the World හා Philips Universal Atlas යන කෘතීන් ද මෙම එකතුවට ඇතුලත් වේ.

ලෝක සිතියම් පොත්වලට අමතරව එක් එක් රටකට පමණක් සීමා වූද, එමෙන්ම එම රට පිළිබඳ විස්තරාත්මක වූ තොරතුරු සපයන සිතියම් පොත් කීපයක්ද එම එකතුවේ ඇත. ශ්‍රී ලංකා ජාතික සිතියම් පොත (National Atlas of Sri Lanka) ඉන්දියානු ජාතික සිතියම් පොත (National Atlas of India) හා අයර්ලන්තය, කැනඩාව හා ඕස්ට්‍රේලියාව යන රටවලට අදාළ වූ සිතියම් පොත් කීපයක් ද මෙහි ඇතුලත් වේ.

### අඟලේ සිතියම්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විශේෂ අවධානයක් යොමු වී ඇත්තේ ශ්‍රී ලංකාවට අදාළ පරිපූර්ණ වූ සිතියම් එකතුවක් ගොඩනැගීම කෙරෙහි ය. ශ්‍රී ලංකාවට අදාළව දැනට පල වී ඇති සිතියම් වර්ග අතුරින් අඟලේ සිතියම් වැදගත් තැනක් ගනී. අඟලේ සිතියමක් යනු පොළවේ සමාන වර්ග අඟල් 63360 ක් සිතියම මත එක අඟලකින් නිරූපනය කිරීමය. කෙටියෙන් හඳුන්වනවා නම් පොළවේ වර්ග සැතපුමක් සිතියමේ එක වර්ග අඟලකට සමානය. මෙම පදනම උඩ මුළු ශ්‍රී ලංකාවම සමාන කොටස් 72 කට බෙදා මූලික අඟලේ සිතියම් 72 ක් නිර්මාණය කර ඇත. එක් එක් අඟලේ සිතියමට අදාලව හැඳුනුම් අංකයක් ඇත. උදා: වශයෙන් මහනුවර අඟලේ සිතියමට හිමි අංකය 48 වේ. මෙම සෑම අඟලේ සිතියමක්ම නැවත සමාන කුඩා කොටස්වලට බෙදා වෙන්කර ඇත. මෙම අඟලේ සිතියම්වල භූවිෂමතා හා සංස්කෘතික ලක්ෂණ මූලිකව පෙන්නුම් කෙරේ. භූමියේ උස දක්වා ඇත්තේ සමෝච්ච රේඛා තුලින් ය. මුහුදු මට්ටම අඩි 0 ලෙස සලකා ක්‍රමයෙන් උස අනුව අඩි 100ත් 100ට සමෝච්ච රේඛා දක්වා ඇත. සම්මත ලකුණු වර්ණ හා විවිධ හැඩ වලින් භූ රූප දක්වා ඇත. සංස්කෘතික ලක්ෂණද සම්මත ක්‍රම අනුව පෙන්නුම් කර ඇත. මෙම අඟලේ සිතියම් 72 න් සිතියම් 68 ක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ දැනට ඇත.

අඟලේ පරිමානයට සකස් කර ගත් සිතියම් අතුරින් පළාත් මායිම්,දිස්ත්‍රික් මායිම් හා මැතිවරණ කොට්ඨාශ දක්වන සිතියම් 60 කට අධික ප්‍රමාණයක් ද ජාතික පුස්තකාලයේ සිතියම් එකතු වේ. ඇත.

### මෙට්‍රික් සිතියම්

ශ්‍රී ලංකා මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් අඟලේ සිතියම් වෙනුවට මෙට්‍රික් වර්ගයේ සිතියම් (1:50,000) හඳුන්වා දී ඇත. අඟලේ සිතියමේ මූලික සැකසීම පදනම් කරගෙන මෙට්‍රික් ක්‍රමයට මුළු ශ්‍රී ලංකාව සමාන කොටස් 92 කට බෙදා මූලික සිතියම් 92 ක් හඳුන්වා දී ඇත. මෙම සෑම සිතියමකටම අංකයක් දී ඇති අතර, එම සෑම මූලික සිතියමක් ම නැවත කොටස් 25 කට බෙදා ඇත. මෙට්‍රික් සිතියමක පරිමානය 1:50,000 කි. එහි තේරුම පොළවේ කිලෝමීටර් එකක් සිතියමේ සෙන්ටි මීටර් 2 කින් නිරූපනය වේ. මේවා හඳුන්වා දී ඇත්තේ 1:50,000 සිතියම් යනුවෙනි. මෙම සිතියම්වල අනු කොටස්වල පරිමාණය 1:10,000 ක් නිසා ඒවා 1:10,000 සිතියම් යනුවෙන් හඳුන්වා ඇත. අඟලේ සිතියම්වල පරිදිම මෙම සිතියම් වලද භූවිෂමතා හා සංස්කෘතික ලක්ෂණ ඇතුලත් කර ඇත. භූ ලක්ෂණ සිතියම්වලට අමතරව Agricultural Base Mapping Project යනුවෙන් සිතියම් පෙලක් ඇත. මෙහි විශේෂයෙන් භූමි පරිභෝග රටාව ඉදිරිපත් කර ඇත. මෙය Land Use Map නම් සිතියම්වලට සමානය. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය මගින් ප්‍රකාශිත මාර්ග සිතියම් (Guide Books) විශාල සංඛ්‍යාවක් සිතියම් එකතු වේ දක්නට ඇත. පැරණි ලංකා සිතියම් ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සිතියම් එකතුවට ලබා ගැනීමට කටයුතු යොදා ඇත. එම සිතියම්වල අළුත් මුද්‍රණ ද (Re-Productions) කිහිපයක් දැනට ලබාගෙන ඇත.

## ජාතික පුස්තකාල සතිය

ජාතික පුස්තකාල සතිය අප්‍රේල් මස 27–මැයි මස 03 කාලය තුළ දී උසස් අන්දමින් සැමරීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සැරසේ. ජාතික පුස්තකාල සතිය ආගමික උත්සවයකින් ආරම්භ වන අතර, එම සතිය මුළුල්ලේම අන්තර් ජාතික මට්ටමේ පොත් ප්‍රදර්ශනයක් සහ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට නියමිතව ඇත. ඔබගේ පුස්තකාලවල විශේෂ වැඩසටහන් සංවිධානය කිරීමෙන් ජාතික පුස්තකාල සතිය සැමරීමට සහභාගි වන මෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සියළුම පුස්තකාල අධිකාරීන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## නව තනතුරු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන් සේවය කළ නාලිනී ද සිල්වා මහත්මිය 1993.02.01 දින සිට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ (තොරතුරු) තනතුරට පත්වීමක් ලැබුවාය.

## සේවයෙන් ඉවත් වීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කළ ආනන්ද සොයිසා මහතා නොබෝදා සේවයෙන් ඉවත් විය.

## ජාතික පුස්තකාල කටයුතු පරිගණක ගතවේ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විවිධ අංශ පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතියක් පසුගිය වසරේ සිට ආරම්භ කර ඇත. මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ජාතික පුස්තකාලයේ විඥාපන තාක්‍ෂණ අංශය නමින් නව අංශයක් මේ වසරේදී පිහිටුවන ලදී. මේ සඳහා සූක්‍ෂම පරිගණක යන්ත්‍ර (Micro Computers) 03ක් මිළට ගෙන ඇති අතර, යුනෙස්කොවේ CDS / ISIS මෘදු කාරක පද්ධතිය මෙම කටයුතු සඳහා යොදා ගැනේ. ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ කටයුතු, ජාතික පුස්තකාල සූචිය, ජාතික ඒකාබද්ධ සූචිය සහ ජාතික ග්‍රන්ථනාමාවලිය පරිගණක ගත කිරීමට මෙහිදී ප්‍රමුඛත්වයක් ලැබේ. CDS / ISIS මෘදු කාරක පද්ධතිය සිංහලයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කර ඇති බව ජාතික පුස්තකාලයේ අධ්‍යක්‍ෂ එම්. එස්. යූ අමරසිරි මහතා 'පුස්තකාල ප්‍රවෘත්ති' වලට සඳහන් කළේය. මේ සඳහා ඉන්දියාවේ විද්‍යාත්මක හා තාක්‍ෂණික අමාත්‍යාංශයේ සහාය ලබා ගැනේ.

## පුස්තකාල සිසුන් සඳහා අවස්ථාවක්

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ අනිකුත් පුස්තකාල අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සඳහා පුස්තකාල කටයුතු පිළිබඳ සේවා පළපුරුද්දක් ලබා ගැනීමට අවස්ථාවක් සැපයීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සූදානම්ව සිටී. මේ අනුව අවම වශයෙන් පුස්තකාල සංගමයේ ප්‍රථම පරීක්‍ෂණය හෝ ඒ හා සමාන පරීක්‍ෂණයකින් සමත් දැනට පුස්තකාල වෘත්තියක නිරත නොවන ශිෂ්‍යයන්හට ජාතික පුස්තකාලයේ අර්ධකාලීන මට්ටමින් සේවය කිරීමට අවස්ථාව සැළසේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු අංශ ප්‍රධාන, පුස්තකාල අධ්‍යාපන හා පුහුණු අංශය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙතින් ලබා ගත හැක.

## ජාතික පුස්තකාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව පරිහරණය කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරුන්ටත්, පුස්තකාල විද්‍යා පාඨමාලා හදාරන ශිෂ්‍යන්ටත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් විශේෂ පහසුකම් සලසා තිබේ. මේ අනුව තම අනන්‍යතාවය සහතික කරන ඉහත සඳහන් අංශවල අයට සාමාජික ගාස්තු ගෙවීමකින් තොරව මෙම පුස්තකාල විද්‍යා එකතුව පරිහරණය කිරීමට අවස්ථාව ලැබේ.

## ජාතික පුස්තකාල දේශන මාලාව 1992

| | | |
|---|---|---|
| ජනවාරි | 'කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල අධ්‍යාපන කටයුතු' | පියදාස රණසිංහ මහතා |
| පෙබරවාරි | **'Kataragama Pada Yathra Tradition'** | **Mr Patric Harrigan** |
| මාර්තු | 'ලිඛිත සන්නිවේදනයේ ජනශ්‍රැති මූලාශ්‍ර - (සිංහල සහරාවලට විශේෂිතව කෙරෙන විමර්ශනයක්)' | ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර |
| අප්‍රේල් | 'ජාතික පුවත්පතක කාර්ය භාරය' | ගාමිණී සුමනසේකර මහතා |
| මැයි | **'International co-operation in expanding access to information'** | **Mr Jacques Tocatlian** |
| ජූනි | 'මානව අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු හා ප්‍රලේඛන සේවා ජාල පද්ධතිය පිළිබඳ හැඳින්වීමක්' | නාලිනී ද සිල්වා මහත්මිය |
| ජූලි | 'කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල පිළිබඳ හැඳින්වීමක්' | එල් ඒ. ජයතිස්ස මහතා |
| අගෝස්තු | 'පුරා විද්‍යාත්මක සාධක මගින් හෙළි වන ශ්‍රී ලංකා-සියම් සම්බන්ධතාව | සිරිනිමල් ලක්දුසිංහ මහතා |
| සැප්තැම්බර් | **'Information services in University Libraries'** | **Prof. Anthony J. Evans** |
| ඔක්තෝබර් | 'ප්‍රකාශන හිමිකම් නීතිය සහ ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හිමිකම් ගැටළු' | සිත්සිරි කාරියප්පෙරුම මහතා |
| නොවැම්බර් | '1992 ඉප්ලා සමුළුව – ඉන්දියාව' | එච්. එම්. ගුණරත්න බණ්ඩා මහතා |
| දෙසැම්බර් | **'The Better Librarian Communicates'** | **Mrs. N. P. Wanasundera** |

# පුස්තකාල ප්‍රමිතීන්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද මහජන, පාසල් සහ දෙපාර්තමේන්තු පුස්තකාලවලට අදාළ ප්‍රමිතීන් පහත දැක්වේ. මෙම ප්‍රමිතීන්ට අනුකූලව තම තමන්ගේ පුස්තකාල පවත්වාගෙන යන මෙන් සියළුම පුස්තකාල අධිකාරීන්ගෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ඉල්ලීමක් කරයි.

## මහජන පුස්තකාල ප්‍රමිතීන්

| | අධි ශ්‍රේණිය | පළමු ශ්‍රේණිය | දෙවන ශ්‍රේණිය | තෙවන ශ්‍රේණිය |
|---|---|---|---|---|
| ගොඩනැගිල්ල<br><br>පොත්පත් | ව.අ. 7500 – 10000<br><br>50000<br>ග්‍රන්ථ නාම 20000 ක<br>ජංගම පුස්තකාල සේවාවක්<br>වාර සඟරා 40<br>ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුන්<br>ප්‍රාදේශීය එකතුන්<br>පුවත්පත් එකතුන් | ව.අ. 2500<br><br>25000<br>ග්‍රන්ථ නාම 10000 ක<br>ජංගම පුස්තකාල සේවාවක්<br>වාර සඟරා 15<br>පුවත්පත් එකතුන්<br>ප්‍රාදේශීය එකතුන් | ව.අ. 1000 – 1500<br><br>10000<br>වාර සඟරා නාම 10<br>පුවත්පත් | ව.අ. 600 – 900<br><br>3000 – 5000 |
| ප්‍රධාන අංශ | බැහැරදීම්, විමර්ශන, ළමා, ප්‍රලේඛන, ශ්‍රව්‍ය දෘශ්‍ය, ව්‍යාපෘති සේවා, සංරක්ෂණ, ශාඛා පුස්තකාල | බැහැරදීම්, විමර්ශන, ජංගම, ප්‍රලේඛන, ශ්‍රව්‍ය දෘශ්‍ය, ළමා, සංරක්ෂණ, ශාඛා පුස්තකාල | බැහැරදීම්, විමර්ශන ජංගම, ළමා, විනෝදාපන සේවා | බැහැරදීම්, විමර්ශන, ළමා |
| වාර්ෂික මුදල් ප්‍රතිපාදන | රු.1,500,000 | රු.250,000 | රු.50,000 | රු.20,000 |
| පාඨක සංඛ්‍යාව | 20000 | 7500 | 3000 | 500 |
| පුස්තකාල වේලාවන් (අවම) | දිනකට පැය 12<br>සතියකට දින 06 | දිනකට පැය 10<br>සතියකට දින 06 | දිනකට පැය 10<br>සතියකට දින 06 | දිනකට පැය 08<br>සතියකට දින 06 |
| කාර්ය මණ්ඩලය | පුස්තකාලයාධිපති<br>අධි ශ්‍රේණිය 01<br>පුස්තකාලයාධිපති<br>I ශ්‍රේණිය 02<br>පුස්තකාලයාධිපති<br>II ශ්‍රේණිය 06<br>පුස්තකාලයාධිපති<br>III ශ්‍රේණිය 14<br>පොත් බැඳුම්කරු 06<br>පුස්තකාල සහායක 06<br>සුළු සේවක 05 | පුස්තකාලයාධිපති<br>I ශ්‍රේණිය 01<br>පුස්තකාලයාධිපති<br>II ශ්‍රේණිය 03<br>පුස්තකාලයාධිපති<br>III ශ්‍රේණිය 06<br>පුස්තකාල සහායක 04<br>සුළු සේවක 05 | පුස්තකාලයාධිපති<br>II ශ්‍රේණිය 01<br>පුස්තකාලයාධිපති<br>III ශ්‍රේණිය 01<br>පුස්තකාල සහායක 01<br><br>සුළු සේවක 01 | පුස්තකාලයාධිපති<br>III ශ්‍රේණිය 01<br>පුස්තකාල සහායක 01<br><br>සුළු සේවක 01 |

17 පිටුව බලන්න

## நூலகவியல், தகவல் விஞ்ஞானம் சம்பந்தமான முதுமானிப் பாடநெறி

கொழும்புப் பல்கலைக்கழகத்தினால் இவ்வருடம் நூலகவியல், தகவல் விஞ்ஞானம் சம்பந்தமான முதுமானிப் பாடநெறி ஆரம்பிக்கப்பட்டுள்ளது. இதன் முக்கிய நோக்கம் நூலகவியல், தகவல் விஞ்ஞானத் துறையில் காணப்படும் பட்டப்பின் படிப்பு வசதியின்மைக் குறைவை நிவிர்த்தியாக்குவதாகும். மற்றும் நூலகவியல், தகவல் விஞ்ஞானத் துறையில் ஈடுபட்டுள்ளோருக்குப் பயிற்சியளிப்பதும், அத்துறையின் தொழினுட்ப அறிவை அவர்கள் மேன்மேலும் பெற்று உபயோகிக்கவும், அத்துறையில் ஆய்வுகளை மேற்கொள்வதின் முக்கியத்துவத்தை உணர்த்துவதும் இப்பாடநெறியின் ஏனைய நோக்கங்களாகும்.

## நூலகங்களைத் தரப்படுத்தல்

இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையினால் 1992ஆம் ஆண்டு, கீழ்க் குறிப்பிட்ட நூலகங்கள் தரப்படுத்தப்பட்டன.

- தேசிய நூதனசாலைத் திணைக்கள நூலகம்
- வன பாதுகாப்புத் திணைக்களநூலகம்
- சட்ட ஆணைக்குழுத் திணைக்கள நூலகம்
- தொகை மதிப்புப் புள்ளிவிபரத் திணைக்கள நூலகம்
- மகாவலி, காணி அமைச்சு நூலகம்
- விளையாட்டு அமைச்சு நூலகம்
- விடமைப்பு திட்டமிடல் நிர்மாண நிலைய நூலகம்
- கடற்றொழில் பயிற்சி அமைச்சு நூலகம்
- கடற்றொழில் அமைச்சு நூலகம்
- எம்பிலிப்பிட்டிய கிராமசேவகர் பயிற்சிஸ்தான நூலகம்
- நுகேகொட சமுத்திராதேவி மகளிர் வித்தியாலய நூலகம்

## கண்காட்சி

1992ஆம் வருடம் இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையினால் நாடு பூராவும் பற்பல நூற்கண்காட்சிகளும் விற்பனை நிலையங்களும் நடத்தப்பட்டன. வாசகர்களுக்குத் தமது நூல் வெளியீடுகளைப் பற்றிய அறிவை வழங்குவதும், நூல்களை மலிவு விலையில் பெற்றுக்கொள்ள ஒரு சந்தர்ப்பம் அளிப்பதும் இந்நூற் கண்காட்சிகளின் முக்கிய நோக்கமாகவிருந்தது. இதன்படி கீழ்க் காணப்படும் நூற் கண் காட்சிகள் சபையினால் நடத்தப்பட்டன.

- களுத்துறை ஜனாதிபதி நடமாடும் சேவை (ஜனவரி)
- அநுராதபுர பொதுசன நூலகம் (பெப்ரவரி)
- பொக்குணுவிட்ட "ஜனசெத" நிலைய நூலகத் திறப்புவிழா (பெப்ரவரி)
- இராஜாங்க அலுவல்கள் அமைச்சு (மார்ச்)
- மாத்தளை மஹாபொல (ஏப்பிரல்)
- வவுனியா ஜனாதிபதி நடமாடும் சேவை (மே)
- புத்தள 92 - கிராமோதயம் (ஜூலை)
- மஹியங்கனை - தேசிய சாகித்திய விழா(செப்டெம்பர்)
- இலங்கைத் தேசிய நூலகம் - சாகித்திய மாதம் (செப்டம்பர்)
- தெஹிவளை - மஹாபொல (ஒக்டோபர்)
- கல்வி, உயர்கல்வி அமைச்சு, இசுருபாய (நொவெம்பர்)

# செய்திகள்

## சர்வதேச நூல் பரிமாற்ற வேலைத் திட்டம்

இலங்கைத் தேசிய நூலகத்துக்கான நூல்கள் மற்றும் ஏனைய சாதனங்களைப் பெற்றுக்கொள்ளும் பல்வேறு முறைகளில், சர்வதேச நூல் பரிமாற்ற வேலைத்திட்டமும் முக்கியமானதாகும். 1992ஆம் ஆண்டு இலங்கைத் தேசிய நூலகமானது 24 பிறநாட்டு நூலகங்களுடன் நூல் பரிமாற்றத்தில் பங்கு கொண்டது. இந்நூலகங்களில் பெரும்பான்மையானவை அவ்வவ் நாட்டுத் தேசிய நூலகங்களாகும்.

## ISBN செயற்றிட்டம்

சர்வதேச நூல் தராதர எண் செயற்றிட்டத்தின் கீழ் 1992ஆம் வருடத்தில் 152 புதிய நூல் வெளியீட்டாளர் பதிவு செய்யப்பட்டனர். இவர்களுள் வர்த்தக வெளியீட்டாளர் 18 பேரும், அரசாங்க, ஏனைய நிறுவனங்கள் சார்ந்த வெளியீட்டாளர்கள் 30 பேரும், ஆசிரிய வெளியீட்டாளர்கள் 84 பேரும் அடங்குவர். 1992ஆம் வருடத்தில் இலங்கைத் தேசிய நூலகத்தினால் 966 ச.நூ.த. எண்கள் நூல் வெளியீட்டாளருக்கு வழங்கப்பட்டன.

## கௌரவிக்கப்பட்ட நூல் வெளியீட்டாளர்

இலங்கையின் முன்னணி வாய்ந்த நூல் வெளியீட்டாளர்களில் ஒருவரான கொடகே வெளியீட்டுத் தாபனத்தின் முகாமைத்துவ நெறியாளர் திரு. எஸ். கொடகே அவர்கள் இலங்கையின் 45வது தேசிய தின விழாவில் கௌரவிக்கப்பட்டார். இலங்கையின் மிக உயர்ந்த விருதுகளில் ஒன்றான "தேசபந்து" விருது, இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் மேன்மை தங்கிய ஜனாதிபதி திரு. ஆர். பிரேமதாசாவினால் இவருக்கு, இலங்கையின் வெளியீட்டுத் துறையில் இவர் ஆற்றிய தொண்டைக் கௌரவிக்கு முகமாக வழங்கப்பட்டது.

## IFLA வின் புதிய செயலாளர் நாயகம்

1992ஆம் வருடம் ஒக்டோபர் மாதம் 1ஆம் திகதி தொடக்கம் IFLA வின் புதிய செயலாளர் நாயகமாக திரு. லியோ வூக்ட் நியமிக்கப்பட்டுள்ளார். இதற்கு முன்பு இப்பதவியை வகித்தவர் திரு. போல்நோட்டா ஆவார். திரு. வூக்ட் நெதர்லாந்து தேசிய நூலகத்தின் கொள்கை அபிவிருத்திப் பிரிவின் தலைவராவார்.

## AIT இல் IFLA ALP புலமைப் பரிசில்கள்

"புதிய தகவல் தொழிநுட்பமும் கணனிப்படுத்தப்பட்ட நூலக சேவைகளும்" என்ற தலைப்பில் 1993ஆம் வருடம் ஜூலை 5 - செப்டம்பர் 24 வரை தாய்லாந்து AIT நிறுவனத்தில் ஒரு பாடநெறி நடத்தப்படும். இதன்பொருட்டு தகுதி பெற்ற சில விண்ணப்பதாரிகளுக்கு சில புலமைப் பரிசில்கள் வழங்கப்படவிருக்கிறது. விண்ணப்பிக்க விரும்புவோர் - பிராந்திய முகாமையாளர், ஆசிய ஒசெனியாவுக்கான IFLA பிராந்திய காரியாலயம், மே/பா. தமசெட் பல்கலைக்கழக நூலகங்கள், பாங்கொக், 10200, தாய்லாந்து என்ற முகவரிக்கு எழுதவும்.

## PUBLISHER HONOURED

A leading Publisher in Sri Lanka, the Managing Director of Godage Publishing Co., **Mr. S. Godage was honoured at the 45th National Day celebration in Sri Lanka.** He was awarded the title '**Desha Bandhu**' (one of the highest honours in Sri Lanka) by **His Excellency R. Premadasa, President, Democratic Socialist Republic of Sri Lanka** for the service he has rendered in the field of publishing in Sri Lanka.

## NEW SECRETARY GENERAL FOR IFLA

**Mr. Leo Voogt has been appointed as the new Secretary General of IFLA from 1st October 1992.** He succeeded Mr. Paul Nauta. Mr Voogt is the Head of Policy Development Division of the National Library of the Neherlands.

## IFLA ALP SCHOLARSHIP TO AIT

A few scholarships are avilable for qualified candidates to attend 'course on new information technology and computerised Library Services' to be offered July 5 - Sept. 24, 1993 at AIT, Thailand. Interested applicants should write to the **'Regional Manager' IFLA Regional Office for Asia and Oceania, C/o Thamasat University Libraries, Bangkok 10200, Thailand.**

## IFLA AWARDS

At present 3 main awards are administers by IFLA.

(i) **Margreet Wijnstroom Fund for Regional Library Development:** Aim of this award is to support 'IFLA's regional offices to involve third world Librarians in the activities of IFLA's professional groups.

(ii) **Guust Van Wesemael Literacy Price**

The aim of this biennial award is to assist a public library in a developing country to purchase books for activities in the field of literacy promotion.

(iii) **Hans-Peter Geh Grant for Conference Participation**

IFLA hopes to sponsor annually a librarian from the former Soviet Union to attend an IFLA Seminar or conference through this award.

## DOCUMENT DELIVERY SERVICES

**ADONIS**
3 Cambridge Ctr., Suite 208
Cambridge, MA 02142

A document delivery system on CD-ROM for journal articles published from 1991 to the present. Covers more than 360 top journals, mainly in biomedical disciplines. Subscription: $ 13,000. Only fills requests from subscribers. When item is found, full-text printout generated. Contact: Paul Aston, 800,-944-6415

# NEWS

**Article Express International Inc,**
Engineering Information Inc. (EI)
Castle Point on the Hudson
Hoboken, NJ 07030-9998

A joint venture of EI and DIA-LOG providing full-text copies of any engineering jounal article, conference paper, or technical report. New attempt to increase speed of access. Academic institutions and corporations can open accounts to get bulk order discounts. Turnaround:standard, five to seven days; rush, 24 hrs. Orders taken via OCLC, FAX, phone, and mail. Delivery by mail, FAX, Scan FAX, courier, Internet. Coats: 1-20 pages, $ 15.40plus $ 4 copyright fee and handling;rush, 1-20 pages, $ 34($ 15+$ 19 surcharge); FAX, $ 34 + 30¢ per page. Telephone for full price info. Contact: Ruth Miller, 800-238-3458

**The British Library (BL)**
Document Supply Centre
Boston SPA, Wetherby, Yorkshire
LS23 7BQ, England

Unique in document delivery, BL is the world's largest document supplier/library. Processes 90% of orders in all subjects from own collection some 15,000 per day for more than 13,000 users. Also lends books and monographs. Keeps 220,000 journals, three million books, plus many hard-to-find items in several subject areas. Has many other services (Journal contents pages, archival copying, publishing, microforms, CD-ROM, online data bases). Orders taken via OCLC, FAX DIALOG, international mail, phone, floppy diskette, ARTTEL, ORBIT, LEXICON. Delivery by international mail, FAX. Costs: standard photocopies, $ 9; FAX and Urgent Action Service, $ 54. To open account, minimum deposit of $ 360. Contact: Michael Osborne, + 44-937546060

**Canada Institute for Scientific**
and Technical Information (CISTI)
Ottawa, Canada K1A OS2

Provides document delivery in the areas of science, technology, engineering, medicine, health sciences, physics, social science research, business, etc. Strong in conference proceedings in all languages and countries. Orders taken by airmail, phone, FAX, Express mail. Delivery by FAX, Express Mail, Internet. Contact: Kathryn J. Mikoski, 613-993-2350

**Chemical Abstracts Service (CAS)**
2540 Olentangy River Rd.
Columbus, OH 43210

Strong in chemistry, chemical engineering, engineering, pure and applied sciences, and foreign materials. $ 500 deposit required to open account. Orders taken via OCLC, DIALOG, BRS, ORBIT, STNORDER, mail, or telephone. Delivery by mail, FAX, courier, or UPS. Turnaround:24 hours from receipt. Costs: $ 10 per document if ordered by STN accession number; $ 14 if ordered by mail, telephone, telex, and FAX; $ 18 if only bibliographic citation. Handling and delivery charges added. Contact: Marian Nichol, 614-447-3670

*(to be continued)*

***(Library Journal / February 1, 1993)***

# ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය හා ශ්‍රී ලංකාව: සංසන්දනාත්මක විග්‍රහයක්

**නාලිනී ද සිල්වා**
අධ්‍යක්ෂ
කාර්මික තාක්ෂණ හා තොරතුරු සේවා මධ්‍යස්ථානය
කාර්මික සංවර්ධන මණ්ඩලය

කිසියම් රටක පළවන ප්‍රකාශන මුද්‍රිත ද්‍රව්‍ය (Printed Material) හා මුද්‍රිත නොවන ද්‍රව්‍ය (Non-Print Material) යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක. මෙහි දී පොත්පත් (Monographs) වාරික ප්‍රකාශන (Serials) සිතියම් (Maps) පුස්තිකා (Pamphlets) යනාදිය මුද්‍රිත ද්‍රව්‍ය ගණයටත්, ශබ්ද පටි (Audio Tapes) වීඩියෝ පටි (Video Tapes) චිත්‍රපටි (Films) සූක්ෂ්ම සේයා පටි (Microfilms) සූක්ෂ්ම කාඩ් පත්‍රිකා (Microfiche) යනාදිය මුද්‍රිත නොවන ගණයටත් අයත් වේ. මෙම ප්‍රකාශන ඒ ඒ රටවල සමාජීය, ආර්ථික හා දේශපාලන තොරතුරු විදහාපාන අතර ඒ ඒ රටවල උත්පාදනය වන දැනුම් සම්භාරය පිළිබඳව ද අවබෝධයක් ලබා දේ.

ලෝකයේ මුද්‍රණ ශිල්පය නව තාක්ෂණය අනුව දියුණුවත්ම විවිධ පර්යේෂණ පිළිබඳ තොරතුරු බහුල වශයෙන් මුද්‍රණයෙන් බිහිවූ අතර, නව විෂයයන් ඇතිවීම හා විෂය විශේෂඥතාවය (Subject Specilization) යනාදිය ප්‍රකාශන ක්ෂෙත්‍රයේ ප්‍රවනතාවයේ නවතම ලක්ෂණ බවට පත් විය. මේ හේතුවෙන් ප්‍රකාශන ක්ෂේත්‍රය ඉතා සංකීර්ණ ස්වරූපයක් ගන්නා ලදී. මෙසේ අධිවේගී ස්වරූපයකින් ප්‍රකාශන පළවීම "Exponential growth" නමින් K.G. Mc Garry හඳුන්වා ඇත. පහත දැක්වෙන විද්‍යාත්මක සඟරා පිළිබඳ සංඛ්‍යා දත්ත ඊට උදාහරණ වශයෙන් දැක්විය හැක.

| වර්ෂය | සඟරා නාම සංඛ්‍යාව (Number of titles) |
|---|---|
| 1750 | 10 |
| 1800 | 100 |
| 1850 | 1000 |
| 1900 | 10,000 |
| 2000 | 400,000 (World list of scientific periodicals) |

තවද 15 වන ශත වර්ෂයේ මැද භාගයේ ජර්මන් ජාතික ගුටන්බර්ග් මුද්‍රණ ශිල්පය ලොවට හඳුන්වා දීමට ප්‍රථම යුරෝපයේ පළ කරන ලද ග්‍රන්ථ සංඛ්‍යාව 30,000 ක් පමණ වේ. එහෙත් 17 වන ශත වර්ෂය ආරම්භ වන විට එම සංඛ්‍යාව මිලියන 1 1/4 ක් ද ක්‍රි.ව. 1800 –1900 දක්වා මිලියන 800 ක් දක්වා ද ඉහළ ගොස් ඇත. ඉහත දැක් වූ විවිධ ප්‍රකාශන වලින් උපරිම ප්‍රයෝජනයක් ගත හැකි පරිදි ඒවායේ පාලනයක් ඇති කිරීම අත්‍යාවශ්‍ය බැව් දෙවන ලෝක යුද්ධ සමයෙන් පසුව ලොවම න්‍යායාත්මකව පිළිගන්නා ලදී. එවක ප්‍රකාශන සොයා ගැනීම හා සංවිධානය කිරීමට පැවැති දුෂ්කරතා ඊට හේතු විය. ග්‍රන්ථ විඥාපන පාලනය (Bibliographic control) පුස්තකාල ක්ෂේත්‍රයට මුලින්ම හඳුන්වා දෙන ලද්දේ ද මෙම වකවානුවෙහි දී ය. ඒ අනුව පුස්තකාලයාධිපතිහු හා විඥාපන නිලධාරීහු (Information Officers) ග්‍රන්ථ විඥාපන පාලනය, සංවිධානය හා තොරතුරු සමුද්ධරණය යන ක්‍රියාවලීන් තුළින් ප්‍රකාශන ක්ෂෙත්‍රයේ සංකීර්ණත්වය මත පැන නැඟී ඇති ගැටළු සඳහා පිළියම් යෙදීමට ඉදිරිපත් වූහ.

ඔවුහු මුහුණ පෑ ප්‍රධාන ගැටළු අතර ලොව විවිධ රටවල ප්‍රකාශන අයත්කර ගැනීම, කුමන විෂයයකට අදාළ කුමන පොත්පත් කුමන රටවල ප්‍රකාශ වී තිබේ දැයි දැන ගැනීම, පර්යේෂණයන්හි නියැලී පිරිස් වඩ වඩාත් සියුම් විෂයයන් කෙරෙහි උනන්දු වීම නිසා වඩ වඩාත් නියත විෂයන්ට අදාළ තොරතුරු සමුද්ධරණය කිරීම ඉන් ප්‍රධාන තැනක් ගත්තේ ය. පරිගණක තාක්ෂණය අනුසාරයෙන් මෙම ගැටළු නිරාකරණය සඳහා උත්සාහ කර ඇතත් තවමත් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය (Universal Bibliographic Control) සියයට සියයක්ම සාර්ථක වී නැත.

**ඉතිහාසය**

ග්‍රන්ථ විඥාපන පාලනය (Bibliographic Control) යන යෙදුම විසිවෙනි සියවසෙහි හතර වන දශකයේ ලොවට හඳුන්වා දෙන ලදී. එහෙත් Konrad Gesner (1516-1565) නැමැත්තා විසින් දුර්ලභ ගණයේ ලතින්, ග්‍රීක් සහ හිබෲ භාෂාවලින් ලියන ලද පොත්පත් අළලා Bibliotheca Universails නමැති ග්‍රන්ථනාමාවලිය සම්පාදනය කිරීම විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා ලොව දරණ ලද මුල්ම ප්‍රයත්නය වශයෙන් හැඳින්විය හැක.

ඊට පසු වකවානුවල Thomas Watt, Jacques Brunet, William Lowndes ග්‍රන්ථ විඥාපන පාලනයට ප්‍රධාන වශයෙන් දායකවූවෝ වෙති. Theodore Bestermann විසින් World Bibliographies of Bibliographies යන්න සම්පාදනය කිරීම විශ්ව ග්‍රන්ථ විඥාපන පාලන ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථානයකි.

ප්‍රංශ ජාතික Francis I (1494-1547) විසින් එක් එක් ජාතීන් විසින් තම තමන්ගේ රටවල ප්‍රකාශන පිළිබඳ තොරතුරු සටහන් කර තැබීමේ සංකල්පය නැතහොත් ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය (National Bibliographic Control) පිළිබඳ ප්‍රථම වරට අදහස් දක්වන ලදී. ඊට අමතරව ඔහු විසින් ඒ සඳහා 1537 දී ප්‍රංශ පාර්ලිමේන්තු විවාද, නීතිරීති පිළිබඳ ප්‍රකාශන ඇතුලත් නීත්‍යානුකූල තැන්පතුවක් (Legal deposit) පාදක කරගෙන ග්‍රන්ථනාමාවලියක් සම්පාදනය කිරීම ද ඓතිහාසික කරුණකි.

යුනෙස්කෝව විසින් 1950 දී මෙම ජාතික ප්‍රකාශන එකතුව (National Collection) පාදක කර ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය කෙරෙහි එක්සත් ජාතීන්ගේ රටවල

අවධානය කැඳවන ලදී. ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනයේ දී පූර්වකාලීන ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විද්‍යාපන තොරතුරු ක්‍රමානුකූලව ඇතුලත් ග්‍රන්ථනාමාවලි සම්පාදනය කිරීම, (Retrospective Bibliographies) ප්‍රවර්තන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රවර්තන ග්‍රන්ථනාමාවලි (Current Bibliographies) සම්පාදනය ද, මුද්‍රණයේ පවතින ග්‍රන්ථ (Books in print) පිළිබඳ තොරතුරු අළලා ග්‍රන්ථනාමාවලි සම්පාදනය යන ක්‍රම තුනම මෙම ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනයට අද අයත් වේ.

යුනෙස්කෝව විසින් ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනය පිළිබඳ සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා විශාල උත්සාහයක යෙදේ. උදාහරණ වශයෙන් 1977 වර්ෂයේ පැරිස් හිදී පවත්වන ලද විශ්ව ප්‍රකාශන සුලභතාවය (Universal Availibility of Publications) සම්මේලනයත්, 1975–79 සහ 1981 – 1982 වකවානු අළලා ලෝකයේ විවිධ රටවල් ග්‍රන්ථ විද්‍යාපන පාලනයට දායක වන ආකාරය පිළිබඳ තක්සේරු කිරීමට කරන ලද සමීක්ෂණ ද, 1982 කැනඩාවේ ඔටාවාහි IFLA/UNESCO සම්මේලනය ද දැක්විය හැක.

ඉහත සමීක්ෂණ මෙන්ම මුද්‍රිත ග්‍රන්ථනාමාවලි අළලා මවිසින් කරන ලද නියැදි සමීක්ෂණයක් ද ඇසුරෙන් ලෝකයේ රටවල් 127 ක් ග්‍රන්ථ විද්‍යාපන පාලනය සඳහා දායක වන ආකාරය මෙම ලිපියෙන් ඉතා ලුහුඬින් දක්වන අතර, ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ විද්‍යාපන ඉතිහාසය හා දැනට දායක වන ආකාරය ද ඉදිරිපත් කරමි. මෙහිදී මවිසින් අවධානය යොමු කරන ලද රටවල් අංක 1 සටහනෙහි දැක්වේ.

මූලික වශයෙන් ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ රටවල් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තීන් මෙන්ම ඒවාට සම්බන්ධ දේශීය ආයතන ආවරණය කරනු ලබන ප්‍රකාශන ද්‍රව්‍ය, දැනට සම්පාදනය කර ඇති මූලාශ්‍ර හා ඒවායේ කාලීනත්වය පිළිබඳව ඉතා ලුහුඬු විග්‍රහයක් මෙයින් ඉදිරිපත් කෙරේ.

ග්‍රන්ථ විද්‍යාපන පාලනය පිළිබඳව ලෝක තත්ත්වය බැලීමේ දී ඒ සඳහා විවිධ රටවල් විවිධාකාරයට සහභාගී වන බව පෙනේ. ඒකාබද්ධ සූචි, ග්‍රන්ථ විද්‍යාපන තොරතුරු පද්ධති (Bibliographic information systems) ග්‍රන්ථ නාමාවලි සම්පාදනය ඉන් සමහරකි. එහෙත් මෙහි දී ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනය කෙරෙහි පමණක් අවධානය යොමු කර ඇත. ඒ අනුව 1. සටහනෙහි දැක්වෙන රටවල් අතුරින් ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනය කරනු ලබන රටවල් සංඛ්‍යාව 83 (△) කි. එම රටවල ජාතික පුස්තකාල හෝ වෙනත් රජයේ ආයතන හෝ පෞද්ගලික ආයතන විසින් මෙම වගකීම දරනු ලැබේ. ඉන් ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනයේ සැහෙන ප්‍රමාදයක් පෙනෙන රටවල් 08 කි. (○) කි. එසේම විශ්ව ග්‍රන්ථ විද්‍යාපන පාලනය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කිරීම ආදිය සඳහා උනන්දු නොවන රටවල් 06 (□) කි. ජාතික ග්‍රන්ථනාමාවලි පරිගණිත රටවල් සංඛ්‍යාව 29 (⊡) කි. පූර්වකාලීන ග්‍රන්ථනාමාවලි සම්පාදනය කරනු ලබන රටවල් 16 (D) කි. එසේම CIP සඳහා උනන්දු වන හෝ සාර්ථකව ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව 16 (*) කි. රටවල් 27 ක ග්‍රන්ථ විද්‍යාපන පාලනය දුර්වල තත්ත්වයක් පවතී. (○) . 1. සටහනෙහි සංකේතයක් නොමැති රටවල් ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය නොකළ ද වෙනත් සංවිධාන හෝ ආයතන ඒ සඳහා උනන්දු වී ඇත.

ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විද්‍යාපන පාලන ඉතිහාසය ගැන සඳහන් කිරීමේ දී තුන්වන ලෝකයේ සෙසු රටවලට වඩා ඉදිරි පියවර කිහිපයක් ගෙන ඇති බැව් පෙනේ. එනම් 1839 අංක 05 දරණ ආඥාපනත අනුව එවක ලංකාවේ පළමු පුවත්පත් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව ඉන් පිටපත් එකක් ප්‍රකාශකගේ අත්සන සහිතව බ්‍රිතාන්‍ය යටත් විජිත ලේකම්වරයාට යවන ලදී. මෙම පනතෙහි "To regulate the printing and publishing of News papers in this Colony" යනුවෙන් සඳහන් වීමෙන් එවක ග්‍රන්ථ විද්‍යාපන පාලනය වක්‍රාකාරව සිදු වූ බව පෙන්වා දිය හැක.

19 වන ශත වර්ෂයේ මැද භාගයෙන් පසුව එනම් ක්‍රි.ව. 1862 පළවූ Ceylon Blue Book යන ප්‍රකාශනයේ එවක ලංකාවේ පළාත් අනුව ප්‍රකාශයට පත් වී ඇති පොත්පත්, වාර්ෂික ප්‍රකාශන පිළිබඳ ලැයිස්තුවක් සහ ඒවායේ පිටපත් සංඛ්‍යාව පිළිබඳ විස්තර ප්‍රථම වරට පළකර තිබීමද ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනයේ තවත් වැදගත් පියවරක් වශයෙන් දැක්විය හැක. 1864 සිට එම ලැයිස්තුවේ මුද්‍රණාල පිළිබඳ තොරතුරු ද අඩංගු කර ඇත. මෙම ප්‍රකාශනය 1884 දක්වා පළවිය. ක්‍රි.ව. 1885 අංක 01 දරණ මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත අනුව ලංකාවේ පළ කරන ලද සියලුම ප්‍රකාශන ලියා පදිංචිය සඳහා කටයුතු යොදන ලද අතර, මුලින් දැක්වූ මූලාශ්‍රවලට වඩා විස්තර සහිත ග්‍රන්ථ විද්‍යාපන තොරතුරු ඇතුලත් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි V වන කොටසෙහි "List of Books printed in Ceylon, registered under Ordinance No. 1 of 1885: entitled an ordinance to provide for preservation of copies of books printed in Ceylon, and for the registration of such books" යනුවෙන් සඳහන් කර ඇත. තවද ලියාපදිංචි අංකය, ග්‍රන්ථනාමය, කර්තෘ, විෂය, මුද්‍රණය, ප්‍රකාශනය, ප්‍රකාශන වර්ෂය, පිටු සංඛ්‍යාව ප්‍රමාණය, සංස්කරණය, පිටපත් සංඛ්‍යාව, මිළ සහ එහි ප්‍රකාශන අයිතිය අයත් පුද්ගලයාගේ නම හා ලිපිනය යනාදි විස්තර එම ලැයිස්තුවට අයත් කර තිබීම එවක ප්‍රකාශන කටයුතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාපන පාලනය සඳහා එය අතිශයින් වැදගත් මූලාශ්‍රයක් බව පෙන්වා දිය හැක.

බ්‍රිතාන්‍ය යටත් විජිතවල මෙවැනි ක්‍රමානුකූල ග්‍රන්ථ විද්‍යාපන පාලනයක් වක්‍රාකාරයෙන් හෝ ප්‍රථම වරට සාර්ථකව ක්‍රියාත්මක වූ රට ශ්‍රී ලංකාව වන අතර, වර්තමාන සාර්ක් කලාපීය රටවල් හා ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනය සැසැඳීමේ දී ශ්‍රී ලංකාව පුරෝගාමීත්වයක් දරණ බව සනාථ වේ.

ජාතික ග්‍රන්ථ විද්‍යාපන පාලනය ක්‍රියාත්මක කිරීමේදී විවිධ රටවල විවිධ ආයතන විවිධාකාරයෙන් දායක වී ඇත. විශේෂයෙන් ජාතික පුස්තකාල හෝ ග්‍රන්ථ විද්‍යාපන පාලනය පිළිබඳ වගකීම පැවරී ඇති වෙනත් රජයේ ආයතන වල පුරෝගාමීත්වය ලොව බහුතරයක් රටවල දක්නට ලැබෙන ලක්ෂණයකි. නමුත් ඩෙන්මාර්කය, නෙදර්ලන්තය, බොලිවියාව, ජෝර්දානය යන රටවල පෞද්ගලික ආයතන මගින් ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනය කරනු ලැබේ.

ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනයේදී අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සම්පාදනය කිරීම අත්‍යාවශ්‍යය. මෙහිදී තොරතුරු හුවමාරු කර ගැනීම මෙන්ම අවශ්‍ය තොරතුරු පහසුවෙන් සොයා ගැනීමට ද උපකාරී වේ.

මේ අනුව උදාහරණ වශයෙන් පිළිගත් වර්ගීකරණ ක්‍රමයක් භාවිතා කිරීම, ISBD ප්‍රමිතීන්ට අනුව තොරතුරු ප්‍රලේඛනය කිරීම, AACR II වැනි අන්තර් ජාතික සූචිකරණ නීතිමාලාවක් අනුගමනය කිරීම මෙන්ම ප්‍රධාන සංලේඛ වලට අමතරව අනුක්‍රමණිකා ආධාරයෙන් තොරතුරු කෙරෙහි යොමු කිරීම ආදී කටයුතු දැක්විය හැක. ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථනාමාවලිය ආරම්භයේ දී ඩිවි දශම වර්ගීකරණයේ 16 වෙනි සංස්කරණය ද පසුව 18 වෙනි සංස්කරණයද 1991 සිට 20 වෙනි සංස්කරණය ද වර්ගීකරණය සඳහා භාවිතා කර ඇති අතර, ISBD ප්‍රමිතිය හා AACR II සූචිකරණ නීතිමාලාවේ සමකාලීන සංස්කරණ ද සූචිකරණය සඳහා භාවිතා කර ඇත.

## පරිගණක නාමාවලි

දැනට ජාතික ග්‍රන්ථනාමාවලී පරිගණක ගත කර ඇති මුළු රටවල් සංඛ්‍යාව 20 (❒) ක් වේ. ඉන් රටවල් 14ක් MARC Format ක්‍රමය උපයෝගී කර ගෙන ඇත. තවද බහුභාෂික ග්‍රන්ථනාමාවලි පරිගණිත කිරීමේ දී විශේෂයෙන් ඇතැම් භාෂා සඳහා පරිගණක මෘදු කාරක (Computer software) සකස් නොවීමේ හේතුවෙන් කොටසක් පරිගණිත ක්‍රමයටත්, කොටසක් මිනිස් ශ්‍රමයෙනුත් සම්පාදනය කර ඇත. උදාහරණ: Malaysian National Bibliography. බල්ගේරියාව, නවසීලන්තය, මෙක්සිකෝව, නයිජීරියාව හා, පෘතුගාලය යන රටවල් ජාතික ග්‍රන්ථනාමාවලී පරිගණිත කිරීම සඳහා මෑතක දී පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය ද සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අළලා පළවන අතර, සිංහල, දෙමළ මෘදු කාරක මෙතෙක් සකස් නොවීමේ හේතුවෙන් එහි පරිගණක කටයුතු ප්‍රමාද වී ඇත. කෙසේ හෝ ඇතැම් ජාතික ග්‍රන්ථනාමාවලීවල මෙන් ඉංග්‍රීසි කොටස පමණක් හෝ පරිගණිත කිරීම සඳහා දැනට යෝජනා කර ඇත.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය හැරුණු විට ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේ දී විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් පළ කරනු ලබන වෙනත් මූලාශ්‍ර බෙහෙවින් උපකාරී වේ. විශේෂයෙන් සම්මන්ත්‍රණ පත්‍රිකා, උපාධි නිබන්ධන, සඟරා ලිපි මෙන්ම ඇතැම් පොත්පත්වල පරිච්ඡේද, පුවත්පත් ලිපි ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියෙහි ආවරණය නොවේ.

විශේෂයෙන්ම මෑතක සිට ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල පළකරන පොත්පත්, වාරික ප්‍රකාශන, පුවත්පත් වුවද ආවරණය වීම ඉතාමත් සීමිත වී ඇත. මෙම ඌනතාවයන් ඇතැම් නාමාවලී මගින් ආවරණය කර තිබේ. ඉන් උදාහරණ කිහිපයක් පහත දැක්වේ. මෙම නාමාවලි අතර ඇතැම් ඒවා පෞද්ගලික පර්යේෂණ වශයෙන්ද, ඇතැම් ඒවා ආයතනික ප්‍රකාශන වශයෙන්ද පරිගණිත ක්‍රමයට පළ කර ඇත.

Bibliography of Ceylon (Sri Lanka) compiled Vols. 1,V by H. A. I. Goonetileke.

Ethnic conflicts and Human Rights in Sri Lanka: an annotated bibliography 1982 - 1987 compiled by Kumar Rupashinghe and Berth Vestapen.

Devinsa bibliography by Marga Institute.

IIMI bibliography by International Irrigation Management Institute.

Sri Lanka Science Index by SLSTIC. Natural Resources Energy and Science Authority.

APINMAP by Ceylon Institute of Scientific and Industrial Research.

Union List of Serials by National Institute of Education. Register of Development Research in Sri Lanka by Centre for Development Information.

Bibliography of Economic and Social Development in Sri Lanka by Centre for Development Information.

මේ හැරුණුවිට ශ්‍රී ලංකාවේ මිනිස් ශ්‍රමයෙන් සම්පාදිත ග්‍රන්ථනාමාවලි රාශියක් වේ. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා පහත සඳහන් කෘතිය මූලාශ්‍රය ඉතා වැදගත් නියමු ග්‍රන්ථයක් වේ.

Bibliography of bibliographies : a guide to catalogues, indexes, bibliographies and bio-bibliographies in Sri Lanka/Compiled by Leelangani Wanasundera. ••

## CIP

ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේදී ඉදිරියට ප්‍රකාශයට පත්වන පොත්පත් පිළිබඳ ග්‍රන්ථ විඥාපන කරුණු සූචිගත කිරීම (Cataloguing - in Publication) නම් වේ. එය දැනට ලෝකයේ ආරම්භ කර ඇති රටවල් (16) (*) කි. එම සංලේඛ ප්‍රවර්තන ජාතික ග්‍රන්ථනාමාවලියේ තොරතුරු අතර කිසියම් සංකේතයක් යොදා ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් පළ කරන ප්‍රකාශන පූර්ව ග්‍රන්ථ නාමාවලිය (Catalogue of Forthcoming Publications) ප්‍රවර්තන ජාතික ග්‍රන්ථනාමාවලියේ අතිරේකයක් වශයෙන් 1989 ජූනි – දෙසැම්බර් කලාපයට ඇතුලත් කර ඇත. එහෙත් එම තොරතුරුවලට අදාළ ග්‍රන්ථ මුද්‍රණයේදී ග්‍රන්ථ නාමය පිටුපස පිටුවෙහි එම සංලේඛ මුද්‍රණය කිරීමක් සිදු නොවේ. විශේෂයෙන් CIP ක්‍රමය දියුණු රටවල ප්‍රකාශකයින් හා මුද්‍රණ කරුවන්ගේ දැඩි උනන්දුව හා සහයෝගය මත ක්‍රියාත්මක වන බවත්, එම සංලේඛ මුද්‍රණ පොත්වල අඩංගු වීම නිසාත් එම ග්‍රන්ථ වර්ගීකරණය හා සූචිකරණ සඳහා පුස්තකාලයාධිපතීන් විසින් ගත කල යුතු කාලය ඉතිරි කිරීමක් සිදුවේ.

අවසාන වශයෙන් ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය කාලීනව සිදු කිරීම පිළිබඳ කොතරම් දුරට විවිධ රටවල් ක්‍රියා කර තිබේ දැයි විමසා බැලීමද සුදුසු ය. විශේෂයෙන් පරිගණක ගත කර ඇති British National Bibliography, Bibliography National Francaise, Australian National Bibliography ඉතාමත් කාලීනව පළවේ. මැලේසියා, සිංගප්පූරුව වැනි රටවල් පරිගණක ගත කර තිබුණද වර්‍ෂයක ප්‍රමාදයක් වේ. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ ප්‍රමාදය දැනට වසරකට අඩු කාලයකි. තායිලන්තයේ ග්‍රන්ථනාමාවලි පරිගණක ගත වුවද සෑහෙන

ප්‍රමාදයක් ඇති රටවල් අතරට එය අයත් වී ඇත. ඒ හැරුණු විට සතිපතා, අර්ධ මාසිකව, මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව ආදී වශයෙන්ද මෙම මූලාශ්‍ර ප්‍රකාශයට පත් වේ. කෙන්යාව වැනි රටවල ග්‍රන්ථනාමාවලි වාර්ෂික ප්‍රකාශනයක් වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

ලෝකයේ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේ වර්තමාන තත්ත්වය ගැන බැලීමේදී ඇතැම් දියුණු රටවල ග්‍රන්ථ විඥාපන තොරතුරු Magnetic Tapes, Microfische මාධ්‍යයෙන් හුවමාරු කෙරේ. උදාහරණ : එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව යනාදී රටවල් සඳහන් කළ හැක. බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ විඥාපන සේවය මගින් 1991 සිට බ්‍රිතාන්‍ය ජාතික ග්‍රන්ථ නාමාවලි CD - ROM ඉලෙක්ට්‍රොනික තැටි මාධ්‍යයට නගා ඇත.

## සාක් රටවල්

ශ්‍රී ලංකාව හා සෙසු සාක් රටවල ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳව අවධානය යොමු කිරීම ද කාලෝචිත යයි සිතමි. බංග්ලාදේශ් ජාතික පුස්තකාලය විසින් 1972 සිට බංග්ලාදේශ් ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය ආරම්භ කර ඇත. මෙය ඇතැම් විට වර්ෂ කිහිපයක් අළලා සම්පාදනය කෙරුණු අවස්ථා ද දක්නට ලැබේ. 1986 සිට බංග්ලාදේශ් ජාතික ග්‍රන්ථනාමාවලිය මාසිකව පළවන ග්‍රන්ථ විඥාපන ලැයිස්තුවක් වශයෙන් පමණක් ප්‍රකාශයට පත් කෙරේ.

භූතානයේ ග්‍රන්ථ විඥාපන පාලනය සැලකීමේ දී ප්‍රවර්තන ජාතික ග්‍රන්ථනාමාවලියක් සම්පාදනය නොකළ ද කෞතුක වස්තු සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා භූතානයේ ජාතික පුස්තකාලය හා අනුබද්ධව පූර්වකාලීන ග්‍රන්ථ එකතුව පිළිබඳ සමීක්ෂණයක් ආරම්භ කර ඇත. අනුතුරුව පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීමට අදහස් කර ඇත.

ඉන්දීය ජාතික ග්‍රන්ථනාමාවලිය 1958 සිට නිත්‍යානුකූල තැන්පතුව පදනම් කරගෙන පළ කර ඇත. ඉන්දියාවේ ප්‍රධාන ප්‍රාන්ත භාෂා 14න් ම පළ කෙරෙන ග්‍රන්ථ විඥාපන තොරතුරු මෙම නාමාවලියේ යෙදීම ඉතා දුෂ්කර බැවින් එම දුෂ්කරතාවය වැළැක්වීම සඳහා පොදු ප්‍රතිපත්තියක් අනුව කේන්ද්‍රගත කොට (Centralized System) රෝමානු අක්ෂර වලින් පමණක් යෙදීම හෝ ඒ ඒ භාෂාවලින් පළවන පොත්පත් අළලා වෙන වෙනම ග්‍රන්ථනාමාවලි පළ කිරීමට අදහස් කර ඇත. ඉන්දියාව ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය සැහෙන ප්‍රමාදයක් පෙන්වන රටවල් අතරට අයත් නොවූවද එහි සම්පාදනය ප්‍රමාදවන බව පෙනේ. උදාහරණ ලෙස 1978 වර්ෂයේ ග්‍රන්ථනාමාවලිය ප්‍රකාශයට පත් කරන ලද්දේ 1985 වර්ෂයේදීය. එමෙන්ම එහි ප්‍රධාන සංස්කාරකවරයෙකු යටතේ භාෂා අනුව සංස්කාරක මණ්ඩලයක් සම්පාදන කාර්යයේ නිරතවන බව පෙනේ. ජාතික ග්‍රන්ථනාමාවලියේ 1985 වර්ෂයට අදාළ මුල් කලාප වශයෙන් 1991 වර්ෂයේ දී පළ කර ඇත. ඉන්දියාව පළකරනු ලබන Books - in - Print ඉන්දියාවේ පළවන ඉංග්‍රීසි පොත්පත් පිළිබඳ තොරතුරු කාලීනව පළ කරන අතර Indian Bibliographies Bureau මගින් පළ කරනු ලැබේ.

නේපාලයේ ග්‍රන්ථ විඥාපන කටයුතු ආරම්භ කිරීම ගැන අවශ්‍ය මුදල් ප්‍රතිපාදන හා පුහුණු කාර්ය මණ්ඩලයක් නොවන බැවින් 1991 වර්ෂය වන විටත් ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීමට අපොහොසත් වී ඇති බැව් වාර්තා වේ.

මේ හැරුණු විට සාර්ක් සංවිධානයට අයත් සෙසු රටවල් වන මාලදිවයින හා පකිස්තානය යන රටවල ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය ඉතාම දුබල තත්ත්වයක ඇත. ජාතික ග්‍රන්ථනාමාවලියේ සැහෙන ප්‍රමාදයක් ඇති රටවල් 08 අතරට පකිස්ථානය ද අයත්වේ.

ශ්‍රී ලංකාව යුනෙස්කෝ ප්‍රමිතීන්ට අනුව ජාතික ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කිරීම සඳහා මුල්වරට දායක වූයේ 1962 දීය. එය 1962 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා පළවූ සිංහල ප්‍රකාශන පමණක් පාදක කොට රාජ්‍ය ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 1963 වර්ෂයේ ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය පළ කර ඇත. එය සම්පාදනය කරන ලද්දේ යුනෙස්කෝ විශේෂඥ ඒ. ජේ. වෙල්ස් මහතාගේ උපදෙස් අනුව එවක සහකාර ලේඛණාරක්ෂක එන්. අමරසිංහ මහතාය. 1963 වර්ෂයේ ජනවාරි – මාර්තු කලාපය ජාතික ග්‍රන්ථනාමාවලිය වෙළුම් 1 අංක වශයෙන් පළකර ඇත. ඇත්ත වශයෙන්ම එහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි ප්‍රකාශන සියල්ලම අඩංගු කර ඇත. එහෙත් 1963 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වකවානුව ආවරණය කර නැත. 1964 සිට 1992 දක්වා දැනට අඛණ්ඩව සම්පාදනය කර ඇත. එම ග්‍රන්ථ නාමාවලි පිරික්සීමේදී මාසික කලාප, ද්විමාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික කලාප වශයෙන් විවිධ කාලසීමා අළලා පළකර ඇති බව පෙනේ. 1992 සිට ත්‍රෛමාසිකව පළ කිරීමට කටයුතු යොදා ඇත. ලෝකයේ වෙනත් ග්‍රන්ථනාමාවලිවල කාලීනතාවය ද මේ අයුරින් විවිධ වකවානුවල වෙනස්වීම් සිදුකර ඇත. උදාහරණ ඉන්දීය ජාතික ග්‍රන්ථනාමාවලිය, ප්‍රංශ ජාතික ග්‍රන්ථනාමාවලිය ෆීජි ජාතික ග්‍රන්ථනාමාවලිය.

ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනයේ සංස්කරණ කාර්යය විශේෂයෙන් මිනිස් ශ්‍රමය උපයෝගී කරගෙන ඇති අවස්ථාවන්හි සංස්කාරක යොදා ඇත. මෙහිදී ග්‍රන්ථ නාමාවලියේ සම්පූර්ණ වගකීම සංස්කාරකවරයෙකු සතු බව ඉන් ප්‍රකාශ වේ. ඇතැම් ග්‍රන්ථනාමාවලිවල ප්‍රධාන සංස්කාරක පමණක් සඳහන් වන අතර, ඇතැම් ඒවායේ ප්‍රධාන සංස්කාරක හා සංස්කාරක මණ්ඩලය ද දක්වා ඇත.

උදාහරණ: වශයෙන් ඉන්දීය ජාතික ග්‍රන්ථනාමාවලිය, පැපුවා නිව්ගිනියා ජාතික ග්‍රන්ථ නාමාවලිය, සිංගප්පූරු ජාතික ග්‍රන්ථනාමාවලිය දැක්විය හැක. විශේෂයෙන් බ්‍රිතාන්‍ය ජාතික ග්‍රන්ථනාමාවලිය වැනි පරිගණක ග්‍රන්ථනාමාවලිවල සම්පාදනය හා සංස්කරණය පරිගණක අනුසාරයෙන් සිදු වන්නක් බැවින් පැහැදිලි සංස්කාරකත්වයක් යොදා නැත. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ විකාශනය පිරික්සීමේදී 1962 සිට 1991 දක්වා සංස්කාරක/උපදේශකවරු වශයෙන් 07 ක් වරින්වර කටයුතු කර ඇත. 1992 සිට පැහැදිලි සංස්කාරකත්වයක් නොමැත.

## කලාපීය නාමාවලි

ඉහත කරුණු අනුව ශ්‍රී ලංකාව ඇතුළුව ලෝකයේ විවිධ රටවල් සිය රටවල ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයට ජාතික මට්ටමින් සහභාගී වී ඇති බව පෙනේ. ඒ හැරුණු විට ඇතැම් රටවල් කලාපීය මට්ටමින් ඊට දායක වී ඇති අයුරුද දක්නට ලැබේ. උදාහරණ : ලෙස 1974 සිට ලතින් ඇමරිකාවේ පළකරනු ලබන ත්‍රෛමාසික ප්‍රකාශනයක් වූ Boletin Bibliografico සඳහා ආර්ජන්ටිනාව, ඉක්වදෝරය,

පැනමාව, එල්සැල්වදෝරු, ගෞතමාලා, නිකරගුවා පැරගුවේ, උරුගුවේ ඇතුළුව රටවල් 20 ක ග්‍රන්ථ විඥාපන තොරතුරු අඩංගු කර ඇත. තවද 1972 සිට උතුරු අප්‍රිකාව සහ මැදපෙරදිග රටවල අරාබි භාෂාවෙන් පළවන ප්‍රකාශන අළලා Arab Bulletin of Publications ප්‍රකාශනය මෙන්ම 1977 සිට කැරිබියානු රටවල් 13 ක ප්‍රකාශන අළලා අධි වාර්ෂිකව පළකරනු ලබන CARICOM Bibliography ඊට උදාහරණ වේ. ඒ අනුව අංක 1 සටහනෙහි සඳහන් රටවලට අමතරව තවත් රටවල් විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනයට චක්‍රාකාරයෙන් සහභාගි වන බව දැක්විය හැක.

## බාධක

සමස්ථයක් වශයෙන් ගත්කල ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලිව පෙනෙන බාධක කිහිපයකි. ඒ අතුරින් දේශපාලන අස්ථාවරත්වය, මූල්‍ය, ප්‍රතිපාදන නොවීම, වෘත්තීය සංවිධාන නොවීම හෝ අදාළ සංවිධාන අතර අන්‍යොන්‍ය සහයෝගයක් නොවීම, ශක්තිමත් නෛතික අඩිතාලමක් නොවීම, නව තාක්ෂණය නොයෙදීම යනාදී කරුණු ගෙන හැර දැක්විය හැක.

© නාලිනී ද සිල්වා 1993

### 1. සටහන

| | | | | | |
|---|---|---|---|---|---|
| අයර්ලන්තය ▲◗ | එක්සත් රාජධානිය ▲□◗✱ | ජෝර්දානය ▲■ | පීරු ▲ | මැඩගස්කර් ▲■○ | ශ්‍රී ලංකාව ▲◗✱ |
| අයිවරිකෝස්ට් ● | ඔස්ට්‍රියාව ◗✱ | ටැන්සානියාව ▲ | පෝලන්තය ▲◗ | මැලේසියාව ▲□✱ | ස්පාඤ්ඤය ▲□◗ |
| අයිස්ලන්තය ▲□◗ | ඕස්ට්‍රේලියාව ▲□✱ | ටියුනීසියාව ▲ | පෘතුගාලය ▲□ | මුරුසිය ▲ | ස්වාසිලන්තය |
| ආර්ජන්ටිනාව ● | ක්වාටර් ▲ | ටෝගෝ | ප්‍රංශය ▲□ | මොනාකෝ | ස්විට්සර්ලන්තය ▲□ |
| ඇමරිකා එක්සත් ජනපදය ▲□✱ | ක්වේට් ● | ට්‍රිනිඩෑඩ් හා ටොබාගෝ ▲ | බයිලෝරුසියාව ▲ | මොරිටේනියාව | ස්වීඩනය ▲□ |
| ඇෆ්ගනිස්ථානය | කැනඩාව ▲□◗✱ | ඩෙන්මාර්කය ▲□ | බල්ගේරියාව ▲□ | මොරොක්කෝව □◗ | සයිප්‍රසය |
| ඇල්ජීරියාව | කෙන්යාව ▲ | ඩොමිනිකන් ජනරජය ▲ | බහාමාස් ● | මොසැම්බික් ● | සයිරේ ● |
| ඇල්බේනියාව ■● | කොන්ගෝව ▲○ | තායිලන්තය ▲□○ | බහරේන් ● | මෝල්ටාව ● | සවුදි අරාබියාව ● |
| ඇංගෝලාව ● | කොරියානු ජනරජය ▲ | තුර්කිය ▲ | බංග්ලාදේශ් ▲■ | යුක්‍රේනය ▲✱ | සැන්මැරිනෝ ▲ |
| ඉක්වදෝරය ● | කොලොම්බියා ▲ | නයිජීරියාව ▲□✱ | බාර්බඩෝස් ▲ | යුගොස්ලෝවියාව | සැම්බියාව ▲ |
| ඉතාලිය ▲□ | කොස්ටරිකා ▲ | නවසීලන්තය ▲✱ | බුරුමය ◗ | යේමනය | සියරාලියෝන් ▲ |
| ඉතියෝපියාව ▲ | ගැම්බියාව ▲ | නැමීබියාව ▲ | බෙනින් ▲ | රුවන්ඩා ◗● | සිම්බාබ්වේ ▲◗ |
| ඉන්දියාව ▲◗ | ගයනාව ▲ | නිකරගුවා ▲ | බෙල්ජියම ▲□✱ | රොමානියා ▲ | සිරියාව ● |
| ඉන්දුනීසියාව ▲ | ග්‍රෙනඩා ● | නෙදර්ලන්තය ▲□✱ | බොට්ස්වානා ▲ | ලක්සම්බර්ග් ▲ | සිංගප්පූරුව ▲□ |
| ඉරාකය ▲ | ඝානාව ▲ | නේපාලය ● | බොලීවියා ● | ලයිබීරියාව | සුඩානය |
| ඉරානය ▲○ | චැඩ් ● | නෝර්වේ ▲□◗ | බ්‍රසීලය ▲□✱ | ලිබියාව | සෙශෙල්ස් ● |
| ඊජිප්තුව ▲ | චිලී ▲○ | පකිස්තානය ▲○ | භූතානය ○ | ලෙසෝතෝ | සෙනෙගාලය ▲ |
| ඊශ්‍රායලය ▲ | චීනය ▲■ | පැනමාව ● | මධ්‍යම අප්‍රිකානු ජනරජය ● | වියට්නාම් සමාජවාදී | සෝමාලියාව ● |
| උගන්ඩාව ● | චෙකොස්ලෝවැකියාව ▲□✱ | පැපුවා නිව්ගිනියාව ▲ | මලාවි ▲■○ | ජනරජය ▲○ | සෝවියට් රුසියාව▲ |
| | ජපානය ▲□✱ | පින්ලන්තය ▲□ | මාලදිවයින ● | වෙනිසියුලාව ▲ | හන්ගේරියාව ▲□ |
| උරුගුවේ | ජර්මනිය (බටහිර) ▲□◗✱ | පිලිපීනය ▲□◗ | මාලි ● | වෝල්ටා ඉහළ | හොන්ඩියුරාස් ▲ |
| එක්සත් කැමරූන් රාජ්‍ය | ජැමෙයිකාව ▲ | පීජී ▲ | මැක්සිකෝව ▲□ | (බර්කිනා ෆැසො)● | |

## References


01. Bibliographic Services throughout the world: supplement 1981-1982. --Paris : Unesco. General Information Programme and UNISIST, 1985

02. Bibliographic Nationale Francaise. -- No. 8 1992. -- Paris : Bibliotheque Nationale.

